# දෙවරක් නොව තෙවරක් සිතිය යුතුයි

# ප්‍රතිජීවක (ඇන්ටිබයොටික්) ඖෂධ දෙපැත්ත කැපෙන කඩුවක් වැනිය

ඇන්ටිබයොටික් යනු බැක්ටීරියා ආසාදන සඳහා භාවිතා කරන ඖෂධ වේ. ප්‍රථම ඇන්ටිබයොටික් ඖෂධය වූ පෙනිසිලින් සහ ඉන් අනතුරුව සොයාගත් ඖෂධ බරපතල ආසාදන වලට ප්‍රතිකාර කිරීමට මහඟු ලෙස උපකාර වූවත් එම ඖෂධ වලට ප්‍රතිරෝධය ඇතිවීමේ වර්ධනය හේතුවෙන් මිනිසා ආසාදන සඳහා ප්‍රතිකාර ලබාගැනීමේදී බරපතල තර්ජනයකට වර්තමානයේදී මුහුණ දීමට සිදුවී ඇත. ඇන්ටිබයොටික් ප්‍රතිරෝධී ආසාදන වැළඳුනහොත් එම ආසාදනය සඳහා ඇතැම්විට ඇන්ටිබයොටික් ඖෂධ නොමැතිවීම හේතුවෙන්, ප්‍රථිකාර කිරීම ඉතාම දුෂ්කර විය හැකිය. එසේම දීර්ඝ කාලයක් ප්‍රතිකාර ගැනීම මෙන්ම තදබල සංකූලතා ඇතිවිය හැකි අතර මරණය ද සිදුවිය හැකිය.

ඇන්ටිබයොටික් ඖෂධ සඳහා වූ ප්‍රතිරෝධය (සාමාන්‍යයෙන් භාවිතා වන ඇන්ටිබයොටික් ඖෂධයට ආසාදනය සුව නොවීමේ ප්‍රවණතාවය) සහිත බැක්ටීරියා මගින් හටගන්නා ආසාදන අවම කිරීම සහ අන් අයට පැතිරීම වැලැක්වීම ඔබගේ වගකීම සහ යුතුකම වන අතර එයට ඔබට නන් අයුරින් දායක විය හැකිය. එමගින් දැනට පවතින වටිනා ඇන්ටිබයොටික් ඖෂධවල ක්‍රියාකාරීත්වය අනාගත පරපුර සඳහා රැකගත හැකිවනු ඇත.

## ඔබ ඒ සඳහා කළ යුතු දෑ ....

- ඇන්ටිබයොටික් ඖෂධ ලබාගත යුත්තේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති සුදුසුකම්ලත් බටහිර වෛද්‍යවරයෙකුගේ නිර්දේශය මත පමණි.
- ඇන්ටිබයොටික් ඖෂධ සෑම ආසාදනයකටම පිළිතුර නොවේ. මේවා බැක්ටීරියා ආසාදන වලට පමණක් ක්‍රියාකරන අතර වෛරස ආසාදන වලට ක්‍රියා නොකරයි. එබැවින් උගුරේ ඇතිවන වෛරස ආසාදන, සෙම්ප්‍රතිශ්‍යාව, පාචනය, දීර්ඝ කාලීන තුවාල ආදියට ඔබගේ හිතුමනාපයට ඇන්ටිබයොටික් ඖෂධ ලබාගැනීමෙන් වැලකීම.
- වෙනත් අයෙකුට නිර්දේශ කළ ඇන්ටිබයොටික් ඖෂධ හවුලේ භාවිතයට ගැනීමෙන් වැලකීම.

- එක් අවස්ථාවකදී නිර්දේශ කරන ලද ඇන්ටිබයොටික් ඖෂධයක් තබාගෙන පසු කාලීනව භාවිතයට ගැනීමෙන් වැලකීම.
- වරක් නිර්දේශ කරන ලද ඇන්ටිබයොටික් ඖෂධ වට්ටෝරුව ඉදිරිපත් කර සමාන රෝග ලක්ෂණ සඳහා නැවත නැවතත් ෆාමසියෙන් ඇන්ටිබයොටික් ඖෂධ ලබා ගැනීමෙන් වැලකීම.
- ඇන්ටිබයොටික් ඖෂධ වෛද්‍යවරයා නිර්දේශ කළ මාත්‍රාව මෙන්ම කාල පරතරය අනුවම ලබාගැනීම.
- ඔබට ඇන්ටිබයොටික් නිර්දේශ කළ කාලයට වඩා දීර්ඝ කාලයක් ලබාගැනීමෙන් වැලකීම.
- ඇස් සහ කන් වලට දමන ඇන්ටිබයොටික් ඖෂධ බිංදු ඒවායේ වට්ටෝරුව අවසන් වූ පසු ඉවත දැමිය යුතුය. ඉතිරි වූ ඖෂධ බිංදු භාවිතය මගින් දරුණු ගණයේ ආසාදන ඇතිවිය හැකිය.
- ඇන්ටිබයොටික් ඖෂධය මගින් සුළු සංකූලතා (වමනය, පාචනය, ආහාර අරුචිය) මෙන්ම දරුණු ගණයේ පාචන තත්ව මෙන්ම වකුගඩු ආබාධ, ශරීර අභ්‍යන්තර සමතුලිතතාව දුර්වල වීම, පෙනීම දුර්වල වීම, සුදු හා රතු රුධිර සෛල, රුධිර පට්ටිකා විනාශවීම වැනි භයානක අතුරු විපාක, අසාත්මිකතාවයන් පවා ඇතිවිය හැකි බව මතක තබා ගැනීම.
- ආසාදන රෝග වලක්වා ගැනීමට ශාරීරික පිරිසිදු බව, මනාව දෑත් සේදීම, ආරක්ෂිත ආහාර හා ජලය භාවිතය මෙන්ම රොගී වූ විට අනෙකුත් පුද්ගලයන් සමඟ සමීප සම්බන්ධය අවම කිරීම.
- වෛද්‍ය උපදෙස් මත රෝගය වැලැක්වීම සඳහා එන්නත් ලබා ගැනීම.
- නිසි පරිදි භාවිතා කරන ඇන්ටිබයොටික් ඖෂධ මිනිස් ජීවිතයට රැකවරණය සලසා ඔබට ඔබේ ආදරණීයන් සමඟ සතුටින් ආසාදන වලින් තොරව ජීවිතය ගත කිරීමට අවස්ථාව උදා කරයි.

**ලෝක ප්‍රතිජීවක (ඇන්ටිබයොටික්)**
**දැනුවත් කිරීමේ සතිය 2021 වෙනුවෙන්.**

ක්ෂුද්‍ර ජීව විශේෂඥයන්ගේ විද්‍යායතනයේ
(Sri Lanka College of Microbiologists) පණිවිඩයකි.